10 ශ්‍රේණිය

# පුරවැසි අධ්‍යාපනය

**අදාල පාඩම කියවා ප්‍රශ්න වලට පිලිතුරු, අදාල ප්‍රශ්නය සමගම සටහන් පොතෙහි ලියන්න.**

## බලය විමධ්‍යගත  කිරීම් හා බලය බෙදාහැරීම.

01)ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක බලයේ අවසාන හිමිකරුවා කවුද?

02)එම බලය හඳුන්වන්නේ කෙසේද?

03)පරමාදීපත්‍ය බලට අයත් මූලික කොටස්

මොනවාද?

***1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව පරමාදීපත්‍ය බලය ක්‍රියාත්මක  වන ආකාරය :**

**ජනතාවගේ ව්‍යවස්ථාදායක බලය - පාර්ලිමේන්තුව විසින්**

**ආරක්ෂාව ඇතුළු ජනතාවගේ විධායක බලය - ජනාධිපතිවරයා විසින්**

**අදිකරණ බලය - අදිකරණ, විනිශ්චය අදිකාරී හා ආයතන විසින්**

04)බලයේ විවිධ ස්වරූප මොනවාද?
05)බලය විමධ්‍යගත කිරීම යනුවෙන් අදහස් වන්නේ කුමක්ද?

මධ්‍යම ආණ්ඩුව සතු පරිපාලන බලතල

↓

ප්‍රාදේශීය පරිපාලන ඒකක

උදා:- පලාත් පාලන ආයතන

06)බලය විමධ්‍යගත කල විට දැකිය හැකි ලක්ෂණ මොනවාද?

## *බලය විමධ්‍යගත කරන ස්වරූප

**1. මධ්‍යම ආණ්ඩුවේ පරිපාලන රටාව විමද්‍යගත කිරීම**

ජාතික මට්ටම → දිස්ත්‍රික් මට්ටම → ප්‍රාදේශීය මට්ටම → ග්‍රාම නිලධාරී කොට්ඨාස මට්ටම

අමාත්‍යාංශ ලේකම් → දිස්ත්‍රික් ලේකම් → ප්‍රාදේශීය ලේකම් → ග්‍රාම නිලධාරී

**2.මධ්‍යම ආණ්ඩුවේ කාර්යයන් ප්‍රාදේශීය පාලන ඒකක වලට පවරා දීම**

මධ්‍යම ආණ්ඩුව

↓

මහ නගර සභා, නගර සභා, ප්‍රාදේශීය සභා

**3.රාජ්‍ය ව්‍යවසායකත්වයට හෝ අදිකාරීයට අයත් බලතල**

↓

**දෙපාර්තමේන්තු, සංස්තා, මණ්ඩල, අදිකාරී**

උදා :- කනිජ තෙල් නීති ගත සංස්තාව, විදුලි බල මණ්ඩලය

07)ඒකීය රාජ්‍යක් යනු කුමක්ද?

08)ඒකීය රාජ්‍යක ලක්ෂණ ලයිස්තුගත කරන්න.

09)ඒකීය රාජ්‍යන්ට නිදසුන් දෙන්න.

10)බලය බෙදාහැරීම යනු කුමක්ද?

11)බලය බෙදාහැරීම තුළ දැකිය හැකි ලක්ෂණ මොනවාද?

12)නූතන රාජ්‍ය බලය බෙදාහැරීමට හේතු මොනවාද?

13)බලය විමද්‍යගත කිරීම හා බෙදාහැරීම අතර වෙනස්කම් ලියන්න.

14)සන්දීය රාජ්‍යක් යනු කුමක්ද?

15)එහි විශේෂ ලක්ෂණ මොනවාද?

16)එම රාජ්‍යවල ප්‍රාදේශීය ආණ්ඩු කෙසේ හඳුන්වයිද?

17)සන්දීය රාජ්‍යක් ලෙස සාර්ථක පැවැත්මක් ඇති කර ගැනීමට තිබිය යුතු ගුණාංග මොනවාද?

18)සන්දීය රාජ්‍යන්ට නිදසුන් දෙන්න.

19)ලෝකයේ සන්දීය රාජ්‍යන්හි දැකිය හැකි නව ප්‍රවණතා මොනවාද?

***සන්දීය රාජ්‍යන්හි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් බලය බෙදාහැරීම සිදුකරන ආකාර තුනකි.**

**1.** මධ්‍යම ආණ්ඩුව සතු බලතල පමණක් ව්‍යවස්ථාවට ඇතුළත් කර ඉතිරි සියලු බලතල ප්‍රාන්ත ආණ්ඩුවලට හිමිකර දීම.

**2.**ප්‍රාන්ත ආණ්ඩුවලට ඇති බලතල පමණක් ව්‍යවස්ථාවට ඇතුළත් කර ඉතිරි සියලු බලතල මද්‍යම ආණ්ඩුවට හිමිකර දීම.

**3.** මධ්‍යම ආණ්ඩුවට හා ප්‍රාන්ත ආණ්ඩුවලට අයත් බලතල ව්‍යවස්ථාවේ දක්වා ඉතිරි සියලු බලතල එම ආයතන දෙකටම හිමිකර දීම.

## බලය බෙදාහැරීම

මධ්‍යම ආණ්ඩුව සතු ව්‍යවස්ථාදායක, විදායක, අදිකරණ බලතල

↓

ප්‍රාන්ත

↓ බලය විමද්‍යගත කිරීම

## ප්‍රාදේශීය පරිපාලන ඒකක

### උදා :- පළාත් පාලන ආයතන

20)ඒකීය ආණ්ඩු ක්‍රමයක් පිළිබඳ මහාචාර්‍ය හර්මන් ෆෙ ෆයිනර් ගේ නිර්වචනය ලියන්න.

***ඒකීය ආණ්ඩු - ඒකීය රාජ්‍යයක් තුළ ක්‍රියාත්මක වන ආණ්ඩු**

**උදා ;- ශ්‍රී ලංකාව, මහා බ්‍රිතාන්‍යය, ප්‍රංශය, මාල මාලදිවයින, බංග්ලාදේශය**

21) ඒකීය ආණ්ඩුක්‍රමයක ලක්ෂණ මොනවාද ?

22)ඒකීය ආණ්ඩු ආණ්ඩු ක්‍රමයක් පැවතීමේ වාසි ලියන්න.

***සන්ධීය ආණ්ඩු - සන්ධීය රාජ්‍ය තුළ ක්‍රියාත්මක වන ආණ්ඩු**

**උදා;- ඇමරිකා එක්සත් ජනපදය, ඕස්ට්‍රේලියාව, ස්විට්සර්ලන්තය**

23)සන්ධීය ආණ්ඩුක්‍රමයක යහපත් ලක්ෂණ මොනවාද?

24)සන්ධිය ආණ්ඩු ක්‍රමයක අයහපත් ලක්ෂණ මොනවාද?

## *ශ්‍රී ලංකාවේ බලය බෙදාහැරීම හා විමධ්‍යගත කිරීමේ ඉතිහාසය

## රජ සමයේදී

උදා:- අනුරාධපුරය යුගයේ පණ්ඩුකාභය රජු විසින් ගම් පාලනයට "ගම්බාර", "ගාමනී" වැනි නිලධාරීන් පත් කිරීම.

:- පොළොන්නරු යුගය තුළ මහා පරාක්‍රමබාහු රජු සමයේ ප්‍රාදේශීය පාලකයින් පත් කිරීම.

## බ්‍රිතාන්‍ය පාලන සමයේදී

**1815** පළාත් පාලනයට "රෙසිඩන්ට්" වරයකු පත්කිරීම

**1865** මහ නගර සභා ආඥා පනත සම්මත කර කොළඹ හා මහනුවර මහ නගර සභා පිහිටුවීම

**1871** ගම්සභා ක්‍රමය නැවත ඇති කිරීම

**1931**ඩොනමෝර් ආණ්ඩු ක්‍රමය මගින් පළාත් පාලන කටයුතු සඳහා විධායක කාරක සභා ඇති කිරීම

**1940** නගර සභා පිහිටුවීම

**1943** පළාත් පාලන ආඥා පනත සම්මත කිරීම

## නිදහසින් පසු

පළාත් පාලන ක්‍රමය දිගටම පවත්වාගෙන යාම

**1980** දිස්ත්‍රික් සංවර්ධන සභා පිහිටුවීම

**1980** ප්‍රාදේශීය මණ්ඩල හා ග්‍රාමෝදය මණ්ඩල පිහිටුවීම

**1987** ප්‍රාදේශීය සභා පිහිටුවීම

## ශ්‍රී ලංකාව බලය බෙදීමට ගත් උත්සාහයන්

**1926 දී එස් ඩබ්ලිව් ආර් ඩී බණ්ඩාරණායක මහතා උඩරට ප්‍රදේශ සඳහා සන්ධීය රාජ්‍යයක් ලබාදීමට කළ යෝජනා**

**1957 බණ්ඩාරනායක - චෙල්වනායගම් ගිවිසුම**

**1965 ඩඩ්ලි - චෙල්වනායගම් ගිවිසුම**

## *ශ්‍රී ලංකාවේ පළාත් සභා පිහිටුවීම

**1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වැනි සංශෝධනයෙන් හා 1987 අංක 47 දරණ පාර්ලිමේන්තු පනත මගින් 1987 දී පළාත් නවය සඳහා පළාත් සභා නවයක් පිහිටුවනු ලැබීය.**

**නිල කාලය - අවුරුදු පහයි.**

25)පලාත් සභාවක ආයතනික ව්‍යුහය ලියා දක්වන්න.

### පළාත් ආණ්ඩුකාරවරයා

**පත්කිරීම්- ජනාධිපති විසින්**

**නිල කාලය - වසර පහයි**

26) ආණ්ඩුකාරවරයා සතු බලතල හා කාර්යයන් ලියා දක්වන්න.

27) මධ්‍යම ආණ්ඩුව හා පළාත් සභාව අතර සම්බන්ධීකරණය සිදු කරන්නේ කවුරුන් විසින්ද ?

28)පලාත් සභාවක සිටිය යුතු අමාත්‍යවරුන් සංඛ්‍යාව කොපමණද?

29) ප්‍රධාන ඇමැති (මහ ඇමති) පත්කරන්නේ කවුරුන්ද?

30)අනිකුත් ඇමතිවරුන් පත්කරන්නේ කවුරුන් විසින්ද?

31) ප්‍රධාන ඇමති හා අමාත්‍ය මණ්ඩලය සතු බලතල හා කාර්‍යයන් මොනවාද?

*පළාත් සභා සතු බලතල හා කාර්යයන් ලැයිස්තු තුනක් යටතේ වර්ගීකරණය කර ඇත

1 වන ලැයිස්තුව (පළාත් සභා ලැයිස්තුව)

2 වන ලැයිස්තුව (සංවෘත ලැයිස්තුව)

3 වන ලැයිස්තුව (සමගාමී ලැයිස්තුව)

පළාත් සභා ලැයිස්තුව - පළාත් සභාව සතු බලතල

සංවෘත ලැයිස්තුව - මධ්‍යම ආණ්ඩුව සතු බලතල

සමගාමී ලැයිස්තුව - මධ්‍යම ආණ්ඩුව හා පළාත් සභාව යන දෙකටම පොදුවේ අයත් බලතල

32) ඉහත  ලයිස්තු තුනෙහි ඇති බලතල ලයිස්තු ගත කරන්න.

පළාත් පාලන ආයතන (මහනගර සභා, නගර සභා ,ප්‍රාදේශීය සභා) මධ්‍යම ආණ්ඩුවේ  පරිපාලන කටයුතු පහසු කිරීමත්, කාර්යක්ශම මහජන සේවාවක් සැපයීමත් ,ප්‍රාදේශීය සංවර්ධනය වේගවත් කිරීමත් අරමුණු කොටගෙන මධ්‍යම ආණ්ඩුව සතු පරිපාලන බලතල විමධ්‍යගත කිරීමට ස්ථාපිත කර ඇත.

33)නගරාදිපති/ සභාපති සතු බලතල හා කාර්යන් මොනවාද?

34)පළාත් පාලන ආයතනවල ප්‍රතිපත්ති සම්පාදනය කරන ආයතනයය කුමක්ද?

35)එහි කාර්යයන් ලැයිස්තුගත කරන්න.

*සන්ධීය රාජ්‍යයන් දෙකක් වන ඇමරිකා එක්සත් ජනපදය හා ස්විට්සර්ලන්තය පිළිබඳ හැදෑරීමට අවස්ථාව ලබා දී ඇත.

## ඇමරිකා එක්සත් ජනපදය

36)ඇමරිකා එක්සත් ජනපදය ආරම්භයේ ප්‍රාන්ත කීයක් තිබුණේද?

37)වර්තමානයේ ප්‍රාන්ත කීයක් තිබේද?

38)ඇමරිකා එක්සත් ජනපදය සන්ධීය රාජ්‍යයක් ලෙස බිහි වීමට හේතු මොනවාද?

39)ඇමරිකා එක්සත් ජනපද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මධ්‍යම ආණ්ඩුවේ බලතල පමණක් ව්‍යවස්ථාවට ඇතුළත් කර ඉතිරි සියලු බලතල ප්‍රාන්ත ආණ්ඩුවලට හිමිකර දී ඇත්තේ කවර අරමුණකින් ද?

40)එහි ව්‍යවස්ථාවේ ප්‍රාන්ත ආණ්ඩු ශක්තිමත් කිරීමට ගෙන ඇති ක්‍රියාමාර්ග මොනවාද?

41)මධ්‍යම ආණ්ඩුව හා ප්‍රාන්ත ආණ්ඩු සතු බලතල වෙනම දක්වන්න.

42)වර්තමානයේ ඇමරිකා එක්සත් ජනපදය තුල මධ්‍යම ආණ්ඩුව ශක්තිමත් වීමේ ප්‍රවණතාවක් දක්නට ලැබීමට හේතු මොනවාද?

43) ස්විට්සර්ලන්තය ය සන්ධීය රාජ්‍යයක් ලෙස බිහි වීමට බලපෑ හේතු මොනවාද?

44)එහි ප්‍රාන්ත හඳුන්වන විශේෂ නම හා ප්‍රාන්ත සංඛ්‍යාව ලියන්න.

45) එහි  ව්‍යවස්ථාදායකයේ ව්‍යුහය ලියා දක්වන්න.

46) එහි සාමූහික විධායකයේ සාමාජිකයින් සංඛ්‍යාව කොපමණද?

47) මධ්‍යම ආණ්ඩුව හා කැන්ටන් සතු බලතල ලියා දක්වන්න

48)එහි සන්ධීය ක්‍රමයේ විශේෂ ලක්ෂණ මොනවාද?

**ඇගයීම :-**

**ඇමරිකා එක්සත් ජනපදය හා ස්විට්සර්ලන්තය යන රාජ්‍යයන් පිළිබඳ තවත් තොරතුරු සොයා එහි පාලනය පිළිබඳ පොත් පිංචක් සාදන්න.**

**(මෙය අනිවාර්ය වේ)**